# ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා

# ගනුදෙනුකරු ප්‍රඥප්තිය

## 1. හැඳින්වීම

1.1 රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොල තුළ ප්‍රාථමික වෙළෙඳුන් විසින් තම ගනුදෙනුකරුවන්හට සපයනු ලබන සේවාවන් ඉතා වැදගත් කොට සැලකේ. ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ණය උපකරණ (ණය සාධන පත්‍ර) බෙදාහැරීමේ විශාලතම සංවිධානාත්මක ක්‍රමය මෙන්ම මූල්‍ය සේවා සැපයීම අතින් ඉතා වැදගත් අංශයකි. ප්‍රාථමික වෙළෙඳ ක්‍රමය මගින් මූල්‍ය සේවා අංශය තුළ ආවරණය කරනු ලබන ප්‍රමාණය දිනෙන් දින ප්‍රසාරණය කෙරෙමින් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සහතික කෙරෙමින් ඔවුන්ට සපයන සේවාවන්හි ගුණාත්මක බව සහ සංයුතිය තවදුරටත් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

1.2 රජයේ සුරැකුම්පත් පිළිබඳ ආයෝජකයන්ගේ රුචිකත්වය, ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය සහ ජාතික ආර්ථිකය යන අංශ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිත්වයන් නියාමන කිරීමේ නිසි ආකෘති ගොඩනැගීමේ මූලිකාංග වේ. ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලෙහි නියාමකයා ලෙස රජයේ සුරැකුම්පත් ප්‍රාථමික අලෙවිකරුවන් විසින් සිය ගනුදෙනුකරුවන්ට සපයනු ලබන සේවාවන් පිළිබඳ විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ ඇගයීමේ ක්‍රියාවලියේ සක්‍රියව නියැලී සිටී.

1.3 මෙම ප්‍රඥප්තිය සඳහා ‘ගනුදෙනුකරු’ යනුවෙන් අදහස් කරනු ලබන්නේ, ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ යම් සේවාවක් හෝ ඒවායේ යම් සම්බන්ධතාවක් මිලදී ගැනීම හෝ විකිණීම එසේ නැතහොත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම සඳහා අදහස් හුවමාරු කරමින් හෝ සාකච්ඡා පවත්වමින් සිටින යම් තැනැත්තෙකු වන අතර එයට පෑ සම්බන්ධය අනුව අවශ්‍ය අවස්ථාවලදී ඒ ගනුදෙනුකරුගේ හෝ ඒ ගනුදෙනුකරුගේ බූදලය සම්බන්ධයෙන් පත් කර ඇති නීත්‍යානුකූල නියෝජිතයා ද ඇතුළත් වේ.

1.4 ආයෝජකයන් විසින් රජයේ සුරැකුම්පත්වල සිය අරමුදල් ආයෝජනය කිරීමේදී ඒ සඳහා තෝරාගන්නා ලද කවර ප්‍රාථමික අලෙවිකරුවකුගෙන් වුවද එක හා සමාන ආරක්ෂණයක් සහතික කිරීම පිණිස, එකී ප්‍රාථමික අලෙවිකරුවන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර ස්ථාවර සම්බන්ධතාවයක් පවත්වා ගැනීම තහවුරු කිරීම් වස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය යැයි හැඟෙන මූලික ප්‍රමිතීන් ස්ථාපිත කිරීම මෙම ප්‍රඥප්ති මඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව ප්‍රාථමික අලෙවිකරුවන් සිය ගනුදෙනුකරුවන් හා ව්‍යාපාර සම්බන්ධතා පවත්වාගෙන යාමේදී අනුගමනය කළ යුතු මනා පරිචයන් මෙයට ඇතුළත් වේ. තවද මෙමගින් ප්‍රාථමික අලෙවිකරුවන්ට

ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම සඳහා ක්‍රමවත් මඟපෙන්වීමක් ලබා දෙන අතරම ගනුදෙනුකරුවන් විසින් තම ප්‍රාථමික අලෙවිකරුවන් කෙරෙහි ඇති වගකීම ද අවධාරණය කරයි.

## 2. අදාළ නෛතික ප්‍රතිපාදන

2.1 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතේ සහ 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ අන්තර්ගත ප්‍රතිපාදනයන්හි වගන්තිවලට අනුව කලින් කලට ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීමට සහ නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සහ රජයේ සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව නියාමනය කිරීමට, අධීක්ෂණය කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලබා දී ඇත.

2.2 මුදල් අමාත්‍යවරයා විසින් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතේ 16 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ 55 වගන්තිය යටතේ නිකුත් කරන ලද 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග වලට අනුව, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලෙහි සංවර්ධනය මෙන්ම ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කටයුතු හා රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොල සම්බන්ධ ඕනෑම කරුණක් පිළිබඳව විධාන නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත.

2.3 **මෙම ගනුදෙනුකරු ප්‍රඥප්තියෙහි වෙනත් ආකාරයකට සඳහන් කොට නොමැති නම් : -**

"සේවා" යනුවෙන් හැඳින්වෙන්නේ 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගවල සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගවල III වන උපලේඛනයට අනුව ප්‍රාථමික අලෙවිකරු සමාගම්වලට සිදු කළ හැකි යැයි බලය පවරන ලද ක්‍රියාකාරකම් සහ කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ හැකි අනෙකුත් ගනුදෙනුය.

## 3. අදාළත්වය

මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරනු ලැබ ඇති සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් සහ එම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ගනුදෙනු කරුවන්ට ද අදාළ වේ.

## 4. පොදු මූලධර්ම

ප්‍රාථමික අලෙවිකරු විසින් තමන් වෙත නිසි ආකාරයෙන් පැවරී ඇති බලතල අනුව ඔහුගේ ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන සියළු සේවා සම්බන්ධයෙන් පහත කරුණු සහතික කළ යුතුය:

(අ) ගනුදෙනුකරුවන්ගේ හිමිකම් මනා ලෙස තහවුරු කිරීම මෙන්ම වෙළෙඳපල විශ්වාසය තහවුරු වන පරිදි අවංකව, සාධාරණව සහ වෘත්තීයමය සැලකිලිමත් ආකාරයට කටයුතු කිරීම;

(ආ) ගනුදෙනුකරුවන්ගේ හිමිකම් මනා ලෙස තහවුරු කෙරෙන පරිදි උද්යෝගිමත්ව, සැලකිලිමත්ව මෙන්ම නිසි නිපුණතාවයකින් යුතුව කටයුතු කිරීම ;

(ඇ) තමන් විසින් සම්පාදනය කරනු ලබන සේවාවකින් සැපයෙන සත්‍ය හෝ අපේක්ෂිත ප්‍රතිලාභ හෝ අලාභ තත්ත්වයන් පිළිබඳව නොසැලකිළිමත්ව සහ ගණනකට නොගනිමින් හෝ හිතාමතාම තම ගනුදෙනුකරු නොමග නොයැවීම;

(ඈ) මෙම ප්‍රඥප්තියට අනුගතවීම පිණිස අවශ්‍ය වන්නාවූ සම්පත්, ප්‍රතිපත්තීන් සහ කාර්ය පටිපාටීන්ට අනුකූලව පරීක්ෂාවන් ඇතුළු පද්ධති සහ පද්ධති පාලන පරීක්ෂාවන් සහ කාර්ය මණ්ඩල පුහුණුව ඵලදායී ලෙස පවත්වා ගැනීම;

(ඉ) තම ගනුදෙනුකරු විසින් අපේක්ෂා කරන සේවාවට අදාළ වන්නා වූ තොරතුරු ගනුදෙනුකරුවන්ගෙන් අපේක්ෂා කිරීම;

(ඊ) අදාළ සේවාව සම්බන්ධයෙන් අදාළ සියළු ගාස්තු ද ඇතුළත්ව තම ගනුදෙනුකරු විසින් දැනගතයුතු සැලකියයුතු අන්දමේ සියළුම තොරතුරු පූර්ණ වශයෙන් ගනුදෙනුකරුට අනාවරණය කිරීම;

(උ) තමන්ගේ හා ගනුදෙනුකරුගේ අරමුණු අතර ගැටීම් සහගත තත්ත්වයන් මගහැරීම;

(ඌ) තම ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම යම් වැරදි සහගත තත්ත්වයන් නිවැරදි කිරීම ද කඩිනමින්, ඵලදායී ලෙස සහ සාධාරණ ලෙස සිදු කිරීම;

(එ) තම ගනුදෙනුකරුවකුට අනවශ්‍ය පීඩනයක් ඇති නොකිරීම හා අනවශ්‍ය බලපෑමක් ඇති නොකිරීම;

(ඒ) තමන් විසින් ප්‍රාථමික වෙළෙන්දෙකු වශයෙන් ඉටු කළයුතු කාර්යභාරය ඉටු කිරීම සඳහා තුන්වැනි පාර්ශවයකින් යම් සේවාවක් ලබා ගැනීමේදී මෙම ප්‍රඥප්තියට අනුකූල වන බවට සහතික වීම;

(ක) තම නීත්‍යානුකූල ව්‍යාපාරික අරමුණු අත්පත් කර ගැනීමට යාමේදී ඒක පාර්ශවීය තත්ත්වයකින් ක්‍රියා නොකිරීම මෙන්ම තම ප්‍රතිපත්තීන්, ක්‍රියා මාර්ග හෝ කාර්ය පටිපාටිය හරහා තම ගනුදෙනුකරුවන්ට සිය මූලික මූල්‍යමය සේවාවන් ලබා ගැනීමට බාධා නොවන ආකාරයෙන් ක්‍රියා කිරීම; සහ

(කා) මෙම ප්‍රඥප්තියෙහි අන්තර්ගත නියමයන් මෙන්ම එමගින් අපේක්ෂිත සාරධර්මවලට ද අනුගත වීම.

## 5. පොදු අවශ්‍යතාවයන්

5.1 ප්‍රාථමික අලෙවිකරු විසින් තමන් වෙත පැමිණෙන පුද්ගලයෙකු විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවෙක් ලෙස හඳුනාගනු ලැබුවහොත්, එහිදී එම ගනුදෙනුකරුගේ විශේෂිත අවශ්‍යතා සැලකිල්ලට ගෙන එකී පුද්ගලයාට ප්‍රාථමික අලෙවිකරු සමග ගනුදෙනු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇති බව තහවුරු කළ යුතුය. මෙම ප්‍රඥප්තිය සඳහා විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවකු යනුවෙන් අදහස් කරනු ලබන්නේ:

(අ) අදාළ පුද්ගලයා ස්වාධීන තීරණයක් ගැනීමේ හැකියාව සහිත නමුත් එසේ කිරීමට ඒ ඒ පුද්ගලයාගේ තත්ත්වය අනුව ඇතැම් විට යම් සහයක් අවශ්‍ය කරන (උදා : ලෙස ශ්‍රවණාබාධ හෝ දෘශ්‍යාබාධිත පුද්ගලයන්) ; සහ/හෝ

(ආ) ස්වාධීන තීරණයක් ගැනීමේ සීමිත හැකියාවක් ඇති සහ එසේ කිරීමට යම් සහායක් අවශ්‍ය වන (උදා : බුද්ධිමය ආබාධයක් පවතින හෝ මානසික සෞඛ්‍ය ගැටළුවක් සහිත) පුද්ගලයන්ය.

5.2 ප්‍රාථමික අලෙවිකරු විසින්, ගනුදෙනුකරුට සපයන සේවාවක නම එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ හා සැසඳීමේදී, ගනුදෙනුකරු නොමග නොයවන සුළු බැව් සහතික කළ යුතුය.

5.3 ප්‍රාථමික අලෙවිකරුවකු තම ගනුදෙනුකරු විසින්ම හෝ ඔහු වෙනුවෙන් සපයන සියළු උපදෙස් නියමිත වේලාවට හා නියමිත සැලකිල්ලට ගෙන ඒ අනුව ක්‍රියාත්මක වී ඇති බව තහවුරු කළ යුතුය.

5.4 ප්‍රාථමික අලෙවිකරු ගනුදෙනුකරු වෙනුවෙන් තමන් වෙත ගෙවනු ලබන ඕනෑම මුදලක් ගනුදෙනුකරුගේ අවශ්‍යතා ඇතුළත්ව ඒ සඳහා සපයනු ලබන/භාවිතා කළ යුතු ලියකියවිලි භාවිතා කරමින්, මුදල් තමා වෙත ලැබුණු වැඩ කරන දින අවසන් වීමට පෙර, එම ගනුදෙනුකරුගේ නමට බැර/ආයෝජනය කිරීමට වගබලාගත යුතුය. එමෙන්ම යම් හේතුවක් මත අදාළ එම මුදල් ගනුදෙනුකරු නමින් බැර/ආයෝජනය කළ නොහැකි තත්ත්වයකදී ප්‍රාථමික අලෙවිකරු තමාගේම අවශ්‍යතා සඳහා එම මුදල් භාවිතා කිරීමෙන් වැලකිය යුතුය.

5.5 ප්‍රාථමික අලෙවිකරු යම් සේවාවක් සඳහා තමා වෙත ගනුදෙනුකරුවකු විසින්, සෘජුවම හෝ ගනුදෙනුකරුවකු වෙනුවෙන් යම් තැනැත්තෙක් විසින් හෝ කරනු ලබන ගෙවීම් සඳහා එම ගනුදෙනුකරුට ලදුපතක්/තහවුරු කිරීමේ ලිපියක් සැපයිය යුතුය. මෙම ලදුපතට/තහවුරු ලිපියට අවම වශයෙන් පහත සඳහන් තොරතුරුවත් ඇතුළත් විය යුතුය:

(අ) ප්‍රාථමික අලෙවිකරුගේ නම සහ ගිණුම් අංකය ;

(ආ) ගෙවීම සිදුකරනු ලබන ගනුදෙනුකරුගේ නම හෝ ගෙවීම සිදු කරනු ලබන්නා එසේ කරනු ලබන්නේ කවුරුන් වෙනුවෙන්ද යන වග;

(ඇ) ගනුදෙනුකරු නමට ලැබුණු ගෙවීමේ වටිනාකම සහ එය ලැබුණු සහ ආයෝජනය කළ දිනය සහ ගනුදෙනුකරු විසින් තැන්පත් කරන ලද/ගෙවන ලද වටිනාකම සහ මුදල් ලැබුණු සහ ආයෝජනය කළ දිනය;

(ඈ) ගෙවීම සිදුකිරීමට හේතුව.

5.6 ප්‍රාථමික අලෙවිකරු විසින් පවතින ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන අයුරින්, නිර්ලේඛිත රජයේ සුරැකුම්පත් සඳහා වූ මධ්‍යම තැන්පත් ක්‍රමයට (Central Depository System) අවශ්‍ය තොරතුරු නියමිත පරිදි ඇතුළත් කර ගනුදෙනුකරුගේ අයිතිවාසිකම් පිළිබඳ හිමිකාරිත්වය එදිනම සහතික කර ඇති බව තහවුරු කළ යුතුය.

5.7 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවකු වෙනුවෙන් කටයුතු කිරීමට නෛතිකව පත් කර ඇති තෙවැනි පාර්ශවයක් සමග ගනුදෙනු කිරීමේදී පහත අවශ්‍යතා සපුරාලිය යුතුය:

(අ) අදාළ බලය පැවරීමේ නෛතික ලියවිල්ලෙහි (Power of Attorney) සහතික කරන ලද පිටපතක් ලබාගැනීම;

(ආ) එම නෛතික ලියවිල්ලට අනුව, එම පුද්ගලයාට එම ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කිරීමේ අවසරය ලබා දී තිබේද යන්න; සහ

(ඇ) අදාළ තුන්වැනි පාර්ශවය ප්‍රාථමික අලෙවිකරු හා ගනුදෙනු කිරීමේදී එම නෛතික බලපත්‍රය මගින් පවරා ඇති බලතල සීමාව තුළ පමණක් ක්‍රියා කරන්නේද යන්න.

5.8 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරු සමග සිදුකරන යම් ලිපි හුවමාරුවකදී හෝ ගිවිසුමකට එළඹීමේදී හෝ (යම් අදාළ නීතියකින් අවසර දී ඇති විටක හැර) පහත දක්වා ඇති තත්ත්වයන් බැහැර කිරීමට හෝ සීමා කිරීමට හෝ බැහැර කිරීමට හෝ සීමා කිරීමට උත්සාහ කිරීම හෝ නොකළ යුතුය:

(අ) යම් නීතියක් යටතේ හෝ පවතින නියාමන අවශ්‍යතා තුළ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ තම ගනුදෙනුකරු කෙරෙහි පවත්නා වගකීමක් හෝ ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්වීම;

(ආ) ගනුදෙනුකරුට යම් සේවාවක් සැපයීමේදී එකී සේවාව සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරු විසින් එකී ගනුදෙනුකරුට දැක්විය යුතු ප්‍රමාණවත් නිපුණතාව හෝ වෙනත් විශේෂිත සැලකිල්ල; හෝ

(ඇ) ගනුදෙනුකරුට යම් සේවාවක් සැපයීමේදී ප්‍රාථමික අලෙවිකරු විසින් අදාළ සේවාව සැපයීම පිළිබඳව සිදු කළ යුතු යැයි සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලබන ඕනෑම වගකීමක් හෝ නිපුණතාවක් ක්‍රියාවට නැංවීමට අපොහොසත් වීම නිසා තමා වෙත ඇති වියහැකි වගකීම.

5.9 ප්‍රාථමික අලෙවිකරු, ඔහු විසින් මෙතෙක් සපයනු ලැබූ සේවාවන් සම්බන්ධයෙන් යම් සංශෝධනයක් හඳුන්වා දීමට ප්‍රථම අපේක්ෂිත සංශෝධනයන් නිසා බලපෑමට ලක් වීමට ඉඩ ඇති තම ගනුදෙනුකරුවන්ට එකී අපේක්ෂිත සංශෝධනයන් පිළිබඳව අවම වශයෙන් මසකට පෙර දැනුම් දිය යුතුය.

5.10 ප්‍රාථමික අලෙවිකරු විසින් සිය ව්‍යාපාර කටයුතු නතර කිරීමට, වෙනත් පාර්ශවයක් සමග බද්ධ වීමට හෝ සිය ප්‍රාථමික අලෙවිකරු කටයුතුවලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ වෙනත් ප්‍රාථමික අලෙවිකරුවකුට පැවරීමට අදහස් කරන විට:

(අ) වහාම ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුවට දැන්විය යුතුය;

(ආ) ප්‍රාථමික අලෙවිකරුගේ ඉහත අපේක්ෂිත ක්‍රියා මාර්ගය නිසා බලපෑමට ලක්වන ගනුදෙනුකරුවන්හට විකල්ප වැඩපිළිවෙලක් සකස් කර ගැනීම් වස් අවම වශයෙන් දෙමසකට පෙර වත් අදාළ වෙනස්කම් පිළිබඳව පූර්ව දැනුම් දීමක් සිදු කළ යුතුය;

(ඇ) ව්‍යාපාරික කටයුතු පැවරීම, වෙනත් ප්‍රාථමික අලෙවිකරුවකුගේ ව්‍යාපාර කටයුතු හා ඒකාබද්ධ කිරීම හෝ ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන්ම නතර කිරීමට පෙර එතෙක් නිම කර නොමැති සියළුම ගනුදෙනු කටයුතු නිසි පරිදි සම්පූර්ණ කර ඇති බව තහවුරු කිරීම සහ දැනටමත් පවත්වාගෙන යන ව්‍යාපාරික කටයුතු වෙනත් ප්‍රාථමික අලෙවිකරුවකුට පැවරීමකදී හෝ වෙනත් ප්‍රාථමික අලෙවිකරුවකු හා ඒකාබද්ධවීමකදී එසේ පැවරීමෙන් හෝ ඒකාබද්ධවීමෙන් අනතුරුව අදාළ ව්‍යාපාර කටයුතු සැපයීම අඛණ්ඩව පවත්වාගෙන යන්නේ කෙසේද යන්න ගනුදෙනුකරුට දැන්වීම; සහ

(ඈ) තම ව්‍යාපාර කටයුතු වෙනත් ප්‍රාථමික අලෙවිකරුවකුගේ ව්‍යාපාර කටයුතු හා ඒකාබද්ධ කිරීමකදී හෝ පැවරීමකදී තම ගනුදෙනුකරු පිළිබඳ තොරතුරු එකී ප්‍රාථමික අලෙවිකරුට බාරදුන් බව අදාළ ඒකාබද්ධ කිරීම හෝ පැවරීම සිදු කරන ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුට දැන්විය යුතුය.

5.11 තම ව්‍යාපාරික ශාඛාවක් වසා දැමීමට, ඒකාබද්ධ කිරීමට, හෝ වෙනත් තැනකට ගෙනයාමට අදහස් කරන විට ප්‍රාථමික අලෙවිකරු විසින් පහත තත්ත්වයන්ට අනුගත විය යුතුය:

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවට වහාම දැන්වීම;

(ආ) විකල්ප වැඩපිළිවෙලක් සකස් කර ගැනීමට හැකි වන පරිදි අදාළ ශාඛාවේ ගනුදෙනුකරුවන්ට අවම වශයෙන් මාස දෙකකටවත් පෙර ඒ බව දැනුම් දිය යුතුය;

(ඇ) වසා දැමීමට, ඒකාබද්ධ කිරීමට හෝ වෙනත් ස්ථානයකට ගෙන යාමට පෙර ශාඛාවේ සියළුම ව්‍යාපාර කටයුතු නියමිත පරිදි සම්පූර්ණ කර ඇති බවට සහතික කර ගැනීම හෝ අදාළ සේවාවන් අඛණ්ඩ වශයෙන් සපයනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව තම ගනුදෙනුකරුට දැන්වීම ; සහ

(ඈ) ව්‍යාපාර කටයුතු වසා දැමීම, ඒකාබද්ධ කිරීම හෝ වෙනත් ස්ථානයකට ගෙනයාම පිළිබඳව පුවත්පත් දැන්වීම් මගින් පොදුවේ මහජනයාට කල්තබා දැන්විය යුතුය.

5.12 ප්‍රාථමික අලෙවිකරු සිය ගනුදෙනුකරු හා කෙරෙන සියළුම සන්නිවේදන කටයුතු ද ඇතුළත්ව තම ගනුදෙනුකරුවන් සමග ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේදී සිංහල හෝ ඉංග්‍රීසි හෝ ද්‍රවිඩ භාෂාව යන භාෂා තුනෙන් ගනුදෙනුකරුවන්ගේ කැමැත්ත පරිදි එක් භාෂාවකින් එකී කටයුතු කිරීම සිදුකළ යුතුය.

5.13 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරු සමග යම් සේවාවක් පිළිබඳව ගිවිසුමට එළැඹෙන අවස්ථාවේදී එකී සේවාව කල්පිරීමේදී අදාළ මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව ලිඛිත උපදෙස් ලබාගත යුතුය. යම් විධියකින් එම සේවාව වසරක් තුළදී එක් වරකට වැඩි වාර ගණනක් කල්පිරෙන විට ප්‍රාථමික අලෙවිකරු විසින් එම ගනුදෙනුකරුගෙන් වාර්ෂික පදනමක් මත අළුතින් ලිඛිත උපදෙස් ලබාගත යුතුය. යම් විධියකින් අදාළ සේවාව කල්පිරීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත වේ නම් සහ කල්පිරීමේදී ලැබෙන මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය ගැන ගනුදෙනුකරුගෙන් ලිඛිත උපදෙස් ද නොමැති අවස්ථාවකදී ද අදාළ ප්‍රාථමික අලෙවිකරු විසින් ස්වයංක්‍රීයව එකී මුදල් නැවත ආයෝජනය කිරීම නොකළ යුතු අතර ඒ එක් එක් කල්පිරීමකදී නැවත ආයෝජනය පිළිබඳව ගනුදෙනුකරුගෙන් ලිඛිතව උපදෙස් ලබාගත යුතුය.

5.14 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුවන් විසින් රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් ආකාරයෙන් පවත්වාගෙන යන මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි ඇතුළත් තොරතුරු සහිත වාරික ප්‍රකාශනයක් විද්‍යුත් තැපැලෙන් හෝ මුද්‍රිත ආකාරයට සාමාන්‍ය තැපැලෙන් ලබා ගත හැකි බවට ඔවුන් දැනුවත් කළ යුතුය. තවද, මධ්‍යම තැන්පත් ක්‍රමයෙහි පවත්නා තම ගිණුම/ම් අන්තර්ජාලය ඔස්සේ නිරීක්ෂණය කිරීමට ද පහසුකම් සලසා ඇති බවට ප්‍රාථමික අලෙවිකරුවන් විසින් තම ගනුදෙනුකරුවන්ට දැනුවත් කළ යුතුය.

## 6. සීමාවන්

### 6.1 ණය :

(අ) ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුගේ පූර්ණ ඉල්ලීමක් නොමැතිව ණය පහසුකම් ලබා දීම නොකළ යුතුය;

(ආ) ප්‍රාථමික අලෙවිකරු විසින් දැනටමත් තම ගනුදෙනුකරුහට සපයා ඇති ණය සීමාව ඉහළ දැමිය හැක්කේ එකී ගනුදෙනුකරු සමග පූර්ව ගිවිස ගැනීමෙන් අනතුරුව පමණි;

(ඇ) ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුට ණයක් සැපයීම හෝ ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කිරීම වෙනුවෙන් ගාස්තුවක් නියම කිරීමේදී සහ එම ගාස්තුව ගනුදෙනුකරුට ලබා දෙන ණය මුදලට ඇතුළත් කිරීමට යෝජනා කර ඇති විට, අදාළ ගාස්තුව වෙනම ගෙවීමේ අයිතිය ගනුදෙනුකරුට ලබා දිය යුතුය.

**6.2 සේවා බද්ධ කිරීම/සංයෝග කිරීම සහ අසම්භාව්‍ය අලෙවි කිරීම**

(අ) ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුට යම් සේවාවක් සැපයීමේදී තවත් සේවාවක් තමන් වෙතින් හෝ වෙනත් තෙවැනි පාර්ශවයකින් ලබාගත යුතුය යන කොන්දේසියට යටත් නොකළ යුතුය. කෙසේ වුවද මෙම සීමාව ප්‍රාථමික අලෙවිකරුගේ දැනට සිටින ගනුදෙනුකරුවෙකු හට යෝජනා කරන එහෙත් අළුත් ගනුදෙනුකරුවෙකුට නොමැති අමතර සේවා සැපයීමට බාධකයක් නොවේ;

(ආ) ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුගේ පිරිවැය අඩුවීමක් සිදුවන අවස්ථාවකදී හැර සේවාවන් කීපයක් බද්ධ කොට අලෙවි නොකළ යුතුය;

(ඇ) ප්‍රාථමික අලෙවිකරු විසින් සේවා සංයෝගයක් එකවර තම ගනුදෙනුකරුවන්ට යෝජනා කිරීමට, නිර්දේශ කිරීමට, සූදානම් කිරීමට හෝ සැපයීමට පෙර පහත දැක්වෙන තොරතුරු නිසි අන්දමේ පුවත්පත් දැන්වීමක් හෝ වෙනත් තහවුරු කළ හැකි මාධ්‍යයකින් ගනුදෙනුකරුට ලබා දිය යුතුය:

(i) ගනුදෙනුකරුට යෝජිත සේවා සංයෝගය සඳහා වැයවන සමස්ථ පිරිවැය;

(ii) එක් එක් සේවාව සඳහා ගනුදෙනුකරුගේ පිරිවැය වෙන් වෙන් වශයෙන්;

(iii) සේවා සංයෝගය තුළ සේවාවන් එකිනෙක මාරු කිරීම සිදු කරන්නේ කෙසේද යන වග;

(iv) සේවා සංයෝගය තුළ සේවාවන් එකිනෙක මාරු කිරීමේදී ගනුදෙනුකරුට දැරීමට සිදුවන අමතර පිරිවැය;

(v) සේවා සංයෝගයෙන් ඉවත් වන්නේ කෙසේද; සහ

(vi) සේවා සංයෝගයෙන් ඉවත් වීමේදී ගනුදෙනුකරුට දැරීමට සිදුවන පිරිවැය.

(ඇ) ප්‍රාථමික අලෙවිකරුගේ ගනුදෙනුකරුවකු දැනටමත් ලබාගෙන ඇති සේවා සංයෝගයකින් එක් සේවාවකින් හෝ කිහිපයකින් හෝ ඉවත් විමට හෝ සමස්ථ සේවා සංයෝගයෙන්ම ඉවත් විමට අදහස් කරන්නේ නම් අදාළ ප්‍රාථමික අලෙවිකරු විසින් එකී ගනුදෙනුකරුට:

(i) ඉහත වගන්ති 6.2 (ඇ) (iii) සහ (iv) හෝ 6.2 (ඇ) (v) සහ (vi) යටතේ අදාළ තොරතුරු ලිඛිතව සැපයිය යුතුය;

(ii) ගනුදෙනුකරුට තම අභිමතය පරිදි සේවා සංයෝගයකින් තමන් කැමති සේවාවක් හෝ කීපයක් තවදුරටත් පවත්වා ගැනීමට අවසර දිය යුතු අතර එහිදී කිසියම් වට්ටමක් අහිමිවීම හැර වෙනත් කිසිදු දඩ මුදලක් හෝ අතිරේක ගාස්තුවක් ගනුදෙනුකරුගෙන් අය නොකළ යුතුය.

.

(ඉ) ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවකුට සැපයෙන මූලික සේවාව සමඟ විකල්පයක් (Option) ඉදිරිපත් කරන විට එම ප්‍රාථමික අලෙවිකරු :

(i) අදාළ ගනුදෙනුකරුට පහත සඳහන් දෑ ලිඛිතව දැනුම් දිය යුතුය:

- ගනුදෙනුකරු විසින් මූලික සේවාව මිලට ගැනීම පිණිස විකල්පය ද මිලට නොගතයුතු බව;

- මූලික සේවාවෙහි පිරිවැය (විකල්ප සේවාව හැර) ; සහ

- විකල්ප සේවාවෙහි පිරිවැය.

(ii) අදාළ ගනුදෙනුකරු විසින් යෝජිත විකල්පය මිලදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර නොමැති විටෙකදී යම් මූලික සේවාවක් සමඟ සම්බන්ධ වූ විකල්පය සඳහා එකී ගනුදෙනුකරුගෙන් කිසිදු ගාස්තුවක් අය නොකළ යුතුය.

(ඊ) 6.2 (ඇ) සිට 6.2 (ඉ) දක්වා ප්‍රතිපාදනයන් සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරු හා ගනුදෙනුකරු අතර සන්නිවේදනය සිදුවනුයේ දුරකථනයෙන් පමණක් නම් ප්‍රාථමික අලෙවිකරු විසින් :

(i) සේවා සංයෝගයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී, නිර්දේශ කරන අවස්ථාවේදී හෝ, පිළියෙල කරන අවස්ථාවේදී, මෙම තොරතුරු වාචිකව සැපයීම; සහ

(ii) සේවා සංයෝගය සැලසුම් කිරීම හෝ සැපයීම අවසන් වූ වහාම ලිඛිතව එහි තොරතුරු ගනුදෙනුකරුට සැපයීම තහවුරු කළ යුතුය.

## 7. බැඳියා පිළිගැටුම (Conflict of interest)

7.1 ප්‍රාථමික අලෙවිකරු, තමාගේ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය, පරිමාණය සහ සංකීර්ණතාවයට ගැලපෙන ලෙස සකස් කරණ ලද බැඳියා පිළිගැටුම් පිළිබඳව නිසි පරිදි අනුමත කළ ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කොට ඊට අනුකූලව සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගත යුතුය. ප්‍රාථමික අලෙවිකරුගේ බැඳියා පිළිගැටුම් පිළිබඳ අදාළ ප්‍රතිපත්තිය තුළ :

(අ) ප්‍රාථමික අලෙවිකරු විසින්ම හෝ ප්‍රාථමික අලෙවිකරු වෙනුවෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේදී ගනුදෙනුකරුගේ හිමිකම්වලට හානි සිදුවීමේ අවදානමක් උත්පාදනය වියහැකි බැඳියා පිළිගැටුම් හටගැනීමේ අවස්ථා සඳහන් කිරීම; සහ

(ආ) බැඳියා පිළිගැටුම් සහගත තත්ත්වයන් සමථයකට පත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත සහ ගතයුතු ක්‍රියාමාර්ග ගැන එහි විශේෂයෙන් සඳහන් කර තිබීම තහවුරු කළ යුතුය.

7.2 බැඳියා පිළිගැටුමක් හටගැනීම සාධාරණ ලෙස වැළැක්විය නොහැකි අවස්ථාවලදී ප්‍රාථමික අලෙවිකරු:

(අ) එකී බැඳියා පිළිගැටුමේ ස්වභාවය සහ/හෝ ප්‍රභවය පිළිබඳව ගනුදෙනුකරු දැනුම්වත් කළ යුතුය. ගනුදෙනුකරු විසින් සෘජුව හෝ වක්‍රව බැඳියා පිළිගැටුමක් පවතින බව දැන සිටින විටකදී, ඔහු/ඇය අදාළ බැඳියා පිළිගැටුම පිළිබඳ දැනුවත් බවට පිළිගෙන ඇති සහ එසේ වුවත් අඛණ්ඩව තමා හා කටයුතු කරගෙන යාමට කැමැත්ත ලිඛිතව පළ කර ඇති අවස්ථා වලදී පමණක් ප්‍රාථමික අලෙවිකරු විසින් සිය ගනුදෙනුකරු හෝ ගනුදෙනුකරුගේ නියෝජිතයන් සමඟ ගනුදෙනු කළ යුතුය;

(ආ) බැඳියා පිළිගැටුම හේතුවෙන් ගනුදෙනුකරුගේ හිමිකම්වලට හානි නොවන බවට සහතික කළ යුතුය.

7.3 ප්‍රාථමික අලෙවිකරු විසින් අතරමැදියකු හරහා ගනුදෙනුකරුට සේවාවන් සැපයීමේදී සහ එසේ ලබාදුන් ව්‍යාපාර කටයුතුවල අගය මත පදනම්ව එම අතරමැදියනට වේතන හෝ වෙනත් පාරිතෝෂික මුදල් ගෙවන තත්ත්වයකදී පහත සඳහන් විධි විධානවලට අනුගත විය යුතුය :

(අ) ගනුදෙනුකරුගේ අපේක්ෂාවන් උපරිම ආකාරයෙන් ඉටුකිරීම් වස් අතරමැදියාගේ කාර්යභාරය හානිකර නොවන බව; සහ

(ආ) ගනුදෙනුකරු සහ අතරමැදියා අතර බැඳියා පිළිගැටුමක් හට ගැනීමට ඉඩක් නොමැති බව.

7.4 ප්‍රාථමික අලෙවිකරු සේවයේ යොදවා ඇති සේවකයන්ගේ වේතන නිර්ණය කිරීම එකී සේවකයන් විසින් ගනුදෙනුකරුවන්ට සිදුකළ මූල්‍ය සේවාවන් සැපයීම, සූදානම් කිරීම හෝ නිර්දේශ කිරීමේ අගයන් මත පිහිටා සිදුකෙරෙන අවස්ථාවකදී එකී වේතන සැකසීමේ ක්‍රමවේදය ප්‍රාථමික අලෙවිකරුගේ පහත දැක්වෙන වගකීම්වලට බලපෑමක් නොකෙරෙන බවට තහවුරු කරගත යුතුය:

(අ) ගනුදෙනුකරුවන්ගේ සුභසිද්ධිය සඳහාම කටයුතු කිරීම ; සහ

(ආ) මෙම ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ යෝග්‍යතා පිළිබඳ අවශ්‍යතා නිසි ලෙස සපුරාලීම.

7.5 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුවන් වෙත විවිධාංගිකරණ වූ සේවාවන් වෙන් වෙන් අංශයන් හරහා සම්පාදනය කෙරෙන තත්ත්වයකදී, ගනුදෙනුකරුවන් සම්බන්ධ එකී එක් එක් ව්‍යාපාර අංශ අතර හෝ ප්‍රාථමික අලෙවිකරු හා එකී ප්‍රාථමික අලෙවිකරුගේ සම්බන්ධිත පාර්ශව අතර බැඳියා පිළිගැටුමක් ඇති වීමට හෝ ගනුදෙනුකරු පිළිබඳ අදාළ තොරතුරු අනිසි ලෙස භාවිතා කිරීමට ඇති ඉඩ වලක්වාලනු වස් ප්‍රමාණවත් අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයන් සමාපාදනය කර ඇති බව තහවුරු කළ යුතුය.

7.6 ප්‍රාථමික අලෙවිකරු විසින් තම අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයන් නිසි ආකාරයෙන් ක්‍රියාවේ යෙදවීම සඳහා මෙන්ම එකී අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයන් කඩකිරීමකදී ගනු ලබන ක්‍රියාමාර්ග ද ආවරණය වන පරිදි ප්‍රමාණවත් ලිඛිත කාර්ය පටිපාටියක් හඳුන්වා දී ඇති බවටත් එම කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රාථමික අලෙවිකරුගේ ආයතනයේ අදාළ සියළු නිලධාරීන් සහ සේවකයන් දැනුම්වත් කර ඇති බවටත් තහවුරු කළ යුතුය.

7.7 ප්‍රාථමික අලෙවිකරු විසින් ආයතනය හෝ එහි සේවයේ නියුතු නිලධාරීන් හෝ සේවකයන් විසින් ඉටු කෙරෙන ව්‍යාපාර කටයුතු නිසි ආකාරයෙන් ඉටු කිරීමට නොහැකි ආකාරයේ බැඳියා පිළිගැටුම් ඇති වියහැකි කිසියම් (මූල්‍ය හෝ වෙනත්) ත්‍යාග හෝ ප්‍රතිලාභයක් ලබා ගැනීම, ලබා දීම හෝ ඒ සඳහා පෙළඹවීම වැළැක්වීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව තහවුරු කළ යුතුය.

## 8. පෞද්ගලික මුණගැසීම් සහ ගනුදෙනුකරුවන් සමග සම්බන්ධතා පවත්වා ගැනීම

8.1 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුවකු හෝ ගනුදෙනකරුවකු බවට පත්වීමට අපේක්ෂිත යම් පුද්ගලයෙකු මුණගැසීම එකී පුද්ගලයාගේ පූර්ණ අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය. එවැනි සියළු පෞද්ගලික මුණගැසීම් ගනුදෙනුකරුගේ පූර්ණ අනුමැතියට යටත් විය යුතුය.

8.2 ප්‍රාථමික අලෙවිකරුවකු තම ගනුදෙනුකරුවකු පෞද්ගලිකව මුණගැසීම අදාල ගනුදෙනුකරුගේ පූර්ණ අනුනමැතියට යටත්ව සිදු කළ යුතුය. එක් එක් පෞද්ගලික මුණගැසීම් සඳහා එකම ගනුදෙනුකරුගේ වුවද වෙන වෙනම අනුමැතීන් ලබාගත යුතු අතර ප්‍රාථමික අලෙවිකරු විසින් ඒ සම්බන්ධව වාර්තාවක් තබාගත යුතුය.

8.3 ඉහත 8.2 හි ප්‍රතිපාදනයන්ට අනුකූල වන ලෙසට, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් යම් ගනුදෙනුකරුවකු පෞද්ගලිකව හමුවීමට ප්‍රථම එකී ගනුදෙනුකරුගේ අනුමැතිය පහත පරිදි ලබාගත යුතුය:

(අ) පෞද්ගලික මුණගැසීමට අදාළ වන හේතුව, විකුණුම් සහ අලෙවිකරණ කටයුතුවලට අදාළ වන පරිදි එම මුණගැසීමේදී සාකච්ඡාවට බඳුන් කරනු ලබන සේවා වර්ග සහ විස්තර; සහ

(ආ) මුණගැසීමට අපේක්ෂිත දිනය සහ වේලාව.

8.4 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවකු සමග දුරකථන සම්බන්ධතාවක් පැවැත්වීමට සිදු කළ යුතු වන්නේ පහත සඳහන් අවස්ථාවලදී පමණි:

(අ) අදාළ ගනුදෙනුකරුට ලබා දී ඇති සේවාවේ ස්වභාවය අනුව, එම සේවාවට අදාළව, එම ගනුදෙනුකරු සමග එවැනි සම්බන්ධතාවයක් පැවැත්වීමට සිදුවී ඇති විට; සහ

(ආ) අදාළ ගනුදෙනුකරු දුරකථන මගින් සම්බන්ධ වීමට පූර්ව කැමැත්ත ප්‍රකාශ කර ඇති විට.

8.5 ප්‍රාථමික අලෙවිකරු තමාගේ දැනට සිටින ගනුදෙනුකරුවන් හැර අන් යම් අයෙකු යම් කිසි විශේෂිත ව්‍යාපාරික කාරණයක් වෙනුවෙන් ඔහුව දුරකථනයෙන් සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කර ඇති විටෙක පමණක් එම පුද්ගලයා එකී කාරණය උදෙසා, දුරකථනයෙන් සම්බන්ධ කරගත හැක.

8.6 ප්‍රාථමික අලෙවිකරු විසින් මෙම ප්‍රඥප්තියට අනුව යම් යම් ගනුදෙනුකරුවකු පෞද්ගලිකව මුණගැසීමට යාමේදී හෝ දුරකථන මගින් සම්බන්ධ කර ගැනීමේදී එකී ප්‍රාථමික අලෙවිකරු නියෝජනය කරන්නා විසින් පහත සඳහන් පිළිවෙල අනුගමනය කල යුතුය:

(අ) ඔහු හෝ ඇය විසින් තමා සහ තමා නියෝජනය කරන ප්‍රාථමික අලෙවිකරණ ආයතනය වහාම හඳුන්වා දිය යුතු අතර, තමාගේ මුණගැසීමේ වාණිජමය අරමුණ පැහැදිළි කළ යුතුය;

(ආ) දුරකථන සංවාදයකදී නම් එකී සංවාදය පටිගත කරන්නේ නම්, ඒ බව එසේ කිරීමට ප්‍රථම ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය;

(ඇ) අවශ්‍ය නම්, ව්‍යාපාරික සම්බන්ධතාවය ගොඩනැගීමට උපකාර වූ මූලාශ්‍රය හෙලිකිරීම හෝ දුරකථන සම්බන්ධතාවය ගොඩනැගීමට උපකාරී වූ යොමු කිරීම් යනාදිය ගනුදෙනුකරුට හෙලි කළ යුතුය;

(ඇ) එසේම, මෙම මුණගැසීම හෝ දුරකථන සබඳතාවය තවදුරටත් පවත්වාගෙන යාමට ගනුදෙනුකරු කැමැත්ත පළ කරන්නේ දැයි තහවුරු කරගත යුතු අතර, යම් හෙයකින් ගනුදෙනුකරු ඒ සඳහා අකැමැත්තක් දක්වන්නේ නම්, මුණගැසීම හෝ දුරකථන සම්බන්ධතාව හෝ වහාම අවසාන කළ යුතුය.

8.7 යම් ගනුදෙනුකරුවකු විසින් විකුණුම් සහ අලෙවිකරණ කටයුතු උදෙසා තමාව නැවත හමු නොවන ලෙසට හෝ තමාව නැවත දුරකථනයෙන් සම්බන්ධ නොකළ යුතු ලෙසට ප්‍රාථමික අලෙවිකරුට දැනුම් දුන් විටෙක, එම ඉල්ලීම ප්‍රාථමික අලෙවිකරු විසින් පිළිගත යුතු අතර, එවැනි ඉල්ලීම් පිළිබඳව වාර්තාවක් ද තබාගත යුතුය.

## 9. සේවා සැපයීමේ ක්‍රියාවලින් සම්බන්ධ වගකීම

9.1 ප්‍රාථමික අලෙවිකරුවකු තම ගනුදෙනුකරුවන්ට නව සේවාවක් හඳුන්වා දීම සඳහා අතරමැදියෙකු යොදාගන්නා අවස්ථාවන්හිදී, එකී අතරමැදියන්ට පහත විස්තර ලබා දිය යුතුය:

(අ) එම සේවාවේ ප්‍රධාන ලක්ෂණ සහ ගුණාංග;

(ආ) එම සේවා ඉලක්ක කරනු ලබන වෙළෙඳපොළ; සහ

(ඇ) එම සේවාවන්හි අන්තර්ගත ආවේණික අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය.

9.2 යම් සේවාවක් අතරමැදියන් මාර්ගයෙන් විකිණීමේදී, එම සේවාවලට අදාළ පැහැදිළි, නිවැරදි, යාවත්කාලීන සහ නොමග නොයවනසුළු තොරතුරු, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අතරමැදියන්ට ලබා දිය යුතුය.

## 10. තොරතුරු සැපයීම

10.1 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවනට තොරතුරු සැපයීමේදී, අදාළ ගනුදෙනුකරුගේ අභිමතය පරිදි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් එක් භාෂාවකින් සැපයිය යුතුය.

10.2 ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුවෙකුට ලබා දෙන තොරතුරු පැහැදිළි, නිවැරදි සහ යාවත්කාලීන විය යුතු අතර සරල සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද ඒවා විය යුතුය. තොරතුරු ඉදිරිපත් කිරීමේ විධික්‍රමය මගින්, වැදගත් තොරතුරු සැඟවීම, හීන කරවීම හෝ තොරතුරු අපැහැදිළි වන ආකාරයට ක්‍රියා නොකළ යුතුය.

10.3 ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුවකුට තත්කාලීන තොරතුරු සැපයිමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය:

(අ) එම අවස්ථාවේ වැදගත්කම; සහ

(ආ) ලබා දෙන ලද තොරතුරු අන්තර්ග්‍රහණය කර, ඒ සඳහා නිසියාකාරව ප්‍රතික්‍රියා දැක්වීමට ගනුදෙනුකරුවකුට අවශ්‍ය වන කාලය.

10.4 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරු සමග සන්නිවේදනය සඳහා විද්‍යුත් මාධ්‍යයක් භාවිතා කරන්නේ නම්, ගනුදෙනුකරුගෙන් ලැබෙන තොරතුරු සහ ගනුදෙනුකරු වෙත සන්නිවේදනය කෙරෙන තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා වීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා ඇති බවට ප්‍රාථමික අලෙවිකරු විසින් තහවුරු කළ යුතුය.

10.5 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරු වෙත ලබා දෙන සියළුම ලිඛිත තොරතුරු සඳහා භාවිතා කරන අකුරුවල විශාලත්වය:

(අ) පැහැදිලි හා කියවීමට හැකි විය යුතුය ; සහ

(ආ) අදාළ ලියවිල්ලට සහ එහි අන්තර්ගත තොරතුරුවලට යෝග්‍ය වන පරිදි විය යුතුය.

10.6 ප්‍රාථමික අලෙවිකරු විසින් යම් ගනුදෙනුකරුවකු සමග දැනටමත් ගිවිසුමකට එළැඹී ඇති යම් කොන්දේසියක් හෝ වගන්තියක් වෙනස් කිරීමේ නිවේදනයක් ප්‍රකාශයට පත් කරන්නේ නම්, එම නිවේදනයේ, කලින් පැවති කොන්දේසිය හෝ වගන්තිය ද, නව කොන්දේසිය හෝ වගන්තිය ද, අදාළ වෙනස බලපවත්වන දිනය ද යන කරුණු අන්තර්ගත විය යුතුය.

10.7 ප්‍රාථමික අලෙවිකරු විසින්, දුරකථන ඇමතුම් සහ වෙබ් අඩවි ද ඇතුළුව තමාගේ තොරතුරු සේවා සැපයීමේ ක්‍රමවේදය මගින් ගනුදෙනුකරුවනට අදාළ කොන්දේසි හෝ වගන්ති ප්‍රකාශයට පත් කරන්නේ නම්, තම කොන්දේසි හෝ වගන්තිවල යම් වෙනස්වීමකදී අදාළ තොරතුරු සේවා සැපයීමේ ක්‍රමවේදයන්හි ද නොපමාව යාවත්කාලීන කළ යුතුය.

10.8 ප්‍රාථමික අලෙවිකරු සිය කොන්දේසීන් හා වගන්ති සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වා ගත යුතු අතර යම් ගනුදෙනුකරුවෙකුට ප්‍රථම වරට සේවාවක් සැපයීමට පෙර එම ගනුදෙනුකරු අභිමත භාෂාවකින් අදාළ කොන්දේසි සහ වගන්තිවල පිටපතක් ලබා දිය යුතුය.

10.9 ප්‍රාථමික අලෙවිකරු සිය ව්‍යාපාර කටයුතු මත පමණක් පදනම්ව සිය ව්‍යාපාරික කොන්දේසීන් සකස් කළ යුතු අතර අවම වශයෙන් එහි පහත කරුණු අඩංගු විය යුතුය :

(අ) නෛතික නාමය, වෙළෙඳ නම/නාමයන්, ලිපිනය සහ ප්‍රාථමික අලෙවිකරුගේ ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් අංකයන්;

(ආ) ප්‍රාථමික අලෙවිකරු යම් සමූහ ව්‍යාපාරයක එක් සාමාජික සංගමයක් පමණක් නම්, ප්‍රාථමික අලෙවිකරු අයත්වන ව්‍යාපාර සමූහයේ නම;

(ඇ) ප්‍රාථමික අලෙවිකරු බලයලත්, බලපත්‍රලාභී හෝ ලියාපදිංචි ප්‍රාථමික අලෙවිකරුවකු බවට තහවුරුවක් සහ අදාළ බලය, බලපත්‍රය ලබාදුන් හෝ ලියාපදිංචිය සිදු කළ අධිකාරියේ නම ;

(ඈ) ප්‍රාථමික අලෙවිකරු මෙම 'ගනුදෙනුකරු ප්‍රඥප්තිය'ට යටත් බවට සහ මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ www.cbsl.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි බවට ප්‍රකාශයක්;

(ඉ) ප්‍රාථමික අලෙවිකරු විසින් සපයනු ලබන සේවා හා ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් ;

(ඊ) ප්‍රාථමික අලෙවිකරු විසින් අයකරණු ලබන ගාස්තු පිළිබඳ පොදු ප්‍රකාශයක්;

(උ) ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික තොරතුරුවල රහස්‍ය භාවය හා එකී තොරතුරු භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරුගේ ප්‍රතිපත්තීන්හි සාරාංශයක්;

(ඌ) බැඳියා පිළිගැටුමට (Conflict of Interest) පිළිබඳව ප්‍රාථමික අලෙවිකරුගේ ප්‍රතිපත්තීන්හි සාරාංශයක් ;

(එ) ගනුදෙනුකරු විසින් ගෙවීම් පැහැර හරින අවස්ථාවකදී ප්‍රාථමික අලෙවිකරු විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සහ පිළියම් පිළිබඳ සටහනක්;

(ඒ) ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරුගේ ක්‍රියාපටිපාටිය පිළිබඳ සාරාංශයක්; සහ

(ඔ) ව්‍යාපාරික ලියවිල්ලෙහි කොන්දේසින්හි බලාත්මක වන දිනය.

10.10 ප්‍රාථමික අලෙවිකරුවකු සිය ව්‍යාපාරික කොන්දේසි ඒ සඳහා විශේෂයෙන් සකස් කළ තනි ලියවිල්ලක් මගින් තම ගනුදෙනුකරුවන්ට ලබා දිය යුතුය.

10.11 ප්‍රාථමික අලෙවිකරු විසින් තම සේවාවක් යම් ගනුදෙනුකරුවකුට ඉදිරිපත් කිරීම, නිර්දේශ කිරීම, පිළියෙල කිරීම හෝ සැපයීමට පෙර අදාළ සේවාවේ මූලික ලක්ෂණ සහ සේවාව

අවබෝධ කර ගැනීමට ගනුදෙනුකරුට සහාය වන තොරතුරු, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ගනුදෙනුකරු අභිමත භාෂාවකින් ලිඛිතව සැපයිය යුතු වේ.

10.12 ප්‍රාථමික අලෙවිකරු විසින් සේවාවක් සැපයීම සඳහා ගනුදෙනුකරු සමග ගිවිසුමකට එළඹීමට පෙර එම සේවාව සැපයීමට අදාළ කොන්දේසි සහ නියමයන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුන අතරින් ගනුදෙනුකරු අභිමත භාෂාවකින් ලිඛිතව ගනුදෙනුකරු වෙත සැපයිය යුතුය.

10.13 ප්‍රාථමික අලෙවිකරු විසින් යම් සේවාවක් ගනුදෙනුකරුවකු වෙත යෝජනා කිරීමට, නිර්දේශ කිරීමට, පිළියෙල කිරීමට හෝ සැපයීමට පෙර පහත අදාළ තොරතුරු ගනුදෙනුකරු වෙත සැපයිය යුතුය.

(අ) ගනුදෙනුකරුගේ අරමුදල්වල සුරක්ෂිතතාව;

(ආ) සේවාව විකිණීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් බලපවත්වන සීමාවන් ;

(ඇ) සේවාවේ ආයෝජනය කරන ලද අරමුදල් එකී සේවාව කල්පිරීමට පෙර නැවත ලබා ගැනීමට ඇති යම් සීමාවන්;

(ඈ) සේවාව නිදහස් කර ගැනීමේදී පවතින සීමාවන්;

(ඉ) කල්පිරීමට පෙර සේවාවෙන් ඉවත් වීමේදී දැරීමට සිදුවන පිරිවැය ද ඇතුළු අනෙකුත් පිරිවැයන් ;

(ඊ) නිර්දේශිත අවම ආයෝජන කාලය; සහ

(උ) ආයෝජනයෙන් ඇස්තමේන්තුගත හෝ අපේක්ෂිත ප්‍රතිලාභය නොලැබියාමේ තත්ත්වයක් ඇති විය හැකි නම්, එම අවදානම පිළිබඳ පූර්ව දැනුම් දීම.

10.14 මිල වෙනස්වීම්, පොළී අනුපාතිකවල උච්ඡාවචනයන් සහ/හෝ විනිමය අනුපාතිකවල චලනයන් ප්‍රාථමික අලෙවිකරු සපයන මූල්‍ය සේවාවේ අගය කෙරෙහි ඇති කළ හැකි බලපෑම්.

10.15 ගනුදෙනුකරුවකු වෙත සේවාවක් සැපයීමට පෙර ප්‍රාථමික අලෙවිකරු විසින්:

(ඇ) තුන්වන පාර්ශව සඳහා වන ගාස්තු ද ඇතුළත්ව ගනුදෙනුකරු වෙත පනවනු ලැබිය හැකි සියළුම ගාස්තු පිළිබඳ සවිස්තරාත්මක ලිඛිත ප්‍රකාශයක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා තුන අතරින් ගනුදෙනුකරු අභිමත භාෂාවකින් සැපයීම; සහ

(ආ) එවැනි යම් ගාස්තුවක් කල්තබා තිරණය කළ නොහැකි අවස්ථාවකදී, ගනුදෙනුවේ කොටසක් ලෙස එම ගාස්තුව ඉදිරියේදී අය කරගනු ලබන බව ගනුදෙනුකරුට පූර්ව දැනුම්දීමක් සිදු කළ යුතුය.

10.16 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුවකු යම් මූල්‍ය සේවාවන් නියමිත කල්පිරීමේ දිනට පෙර ඉවත් කර ගැනීමේදී/අවසාන කිරීමේදී වෙළෙඳපොල පොලී අනුපාතිකයන්ට අනුව අලාභය/වන්දිය/අව මිලක් සිදු වියහැකි බව ගිවිසුමට එළඹෙන අවස්ථාවේදීම ගනුදෙනුකරුට දැන්වීම කළ යුතුය;

10.17 ප්‍රාථමික අලෙවිකරු විසින් අයකරනු ලබන සියළු ගාස්තු සහ අයකිරීම් පිළිබඳ උපලේඛනයක් ගනුදෙනුකරුට පහසුවෙන් කියවිය හැකි ආකාරයට ප්‍රාථමික අලෙවිකරු විසින් සිය අයදුම් පත්‍රයෙහි අන්තර්ගත කළ යුතුය. ප්‍රාථමික අලෙවිකරුට වෙබ් අඩවියක් තිබේ නම් තම සේවා ගාස්තු සහ අයකිරීම් ලේඛනය අදාළ වෙබ් අඩවියේ ද ප්‍රසිද්ධ කළ යුතුය

10.18 ගාස්තුවල ඉහළ යාමක් සිදුවේ නම් එම වෙනස සිදු කිරීමට අවම වශයෙන් දින 30 කට පෙර ප්‍රාථමික අලෙවිකරු විසින් සංශෝධිත ගාස්තුවල බලපෑමට ලක් වන ගනුදෙනුකරුවන්ට පැවති ගාස්තුව සහ නව ගාස්තුව ද ඇතුළත්ව ගාස්තු සංශෝධනය හෝ නව ගාස්තු හඳුන්වා දීම පිළිබඳව දැනුවත් කළ යුතුය.

## 11. ගනුදෙනුකරු සහ යෝග්‍යතාවය හඳුනා ගැනීම

11.1 ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුට යම් සේවාවක් ඉදිරිපත් කිරීම, නිර්දේශ කිරීම, පිළියෙල කිරීම හෝ සැපයීමට පෙර අදාළ ගනුදෙනුකරුට මූල්‍ය සේවාවේ යෝග්‍ය බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු රැස් කිරීම සහ වාර්තා තබා ගැනීම සිදු කළ යුතුය. රැස් කර ගන්නා තොරතුරුවල ප්‍රමාණවත් බව ගනුදෙනුකරු විසින් තෝරාගත් සේවාවේ ස්වභාවය සහ සංකීර්ණ බව යන කරුණු මත පදනම් වන නමුත් රැස් කර ගන්නා තොරතුරු ප්‍රමාණය ප්‍රාථමික අලෙවිකරුට වෘත්තීමය සේවාවක් සැපයීමට තරම් ඉඩ ලබා දෙන මට්ටමකට පැවතිය යුතුය.

11.2 11.1 විධිවිධාන හා අනුකූල වීමට ප්‍රමාණවත් තොරතුරු ගනුදෙනුකරු විසින් සැපයීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී, අදාළ සේවාව ගනුදෙනුකරු සඳහා යෝග්‍ය කෙතරම්ද යන්න තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු නොමැතිකම නිසා එකී සේවාව ලබා දීමට නොහැකි බව ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුට ලිඛිතව දැනුම් දිය යුතුය.

11.3 ගනුදෙනුකරුවෙකු සඳහා යම් සේවාවක යෝග්‍යතාවය තක්සේරු කිරීමේදී, ප්‍රාථමික අලෙවිකරු විසින්, අවම වශයෙන්, 11.1 විධිවිධානය යටතේ රැස් කළ තොරතුරු මත පදනම්ව පහත කරුණු සලකා බැලීම සහ ලේඛනගත කිරීම සිදු කළ යුතුය:

(අ) අදාළ සේවාව ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයන් සහ අරමුණුවලට ගැලපේද;

(ආ) ගනුදෙනුකරුට;

(i) සේවාව ආශ්‍රිතව පැන නැගිය හැකි මූල්‍යමය වගකීම් අවශ්‍ය පරිදි අඛණ්ඩව පවත්වා ගැනීමට හැකියාවක් පවතිද; සහ

(ii) සේවාවට අදාළ ඕනෑම මූල්‍ය අවදානමක් දැරිය හැකිද; සහ

(ඇ) යෝජිත සේවාව ආශ්‍රිත අවදානම දැරීම පිළිබඳ ගනුදෙනුකරුගේ පවතින ආකල්ප හා අනුගත වන්නේද යන බව.

11.4 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරු විසින් අනාවරණය කළ කරුණු හා එම ගනුදෙනුකරු පිළිබඳ තමා ද දන්නා කරුණු ද මත පදනම්ව, තමා විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් සේවාවක් එම ගනුදෙනුකරුට යෝග්‍ය බව තහවුරු කරගත යුතුයි.

**12. වෙළෙඳ ප්‍රචාරණය**

12.1 ප්‍රාථමික අලෙවිකරු විසින් තම වෙළෙඳ ප්‍රචාරණය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු තහවුරු කළ යුතුය:

(අ) වෙළෙඳ දැන්වීමේ නිර්මාණය, ඉදිරිපත් කිරීම සහ අන්තර්ගතය පැහැදිලි, සාධාරණ, නිවැරදි සහ නොමග නොයවනසුළු බව;

(ආ) වෙළෙඳ දැන්වීම මගින් වැරදි අර්ථගැන්වීම් ඇති කිරීම හෝ, අතිශයෝක්තිය හෝ ඇතැම් කරුණු මගහැරීම මගින් ප්‍රචාරණය කරන ලද සේවාව හෝ ප්‍රාථමික අලෙවිකරු කෙරෙහි ගනුදෙනුකරුගේ ඇති ආකල්පවලට උද්දීපනයක් ඇති කිරීමට උත්සාහ නොකරන බව; සහ

(ඇ) ප්‍රචාරණය කරන ලද සේවාවේ ස්වභාවය සහ වර්ගය පැහැදිළි විය යුතු අතර එය කිසිම අයුරකින් අපැහැදිළි නොවිය යුතුය.

12.2 12.1 විධානයෙන් දැක්වෙන අවශ්‍යතාවන්ට සීමා නොවන අයුරින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තම වෙළෙඳ දැන්වීම නොමග නොයවනසුළු එකක් බව ප්‍රාථමික අලෙවිකරු විසින් තහවුරු කරගත යුතුය:

(අ) ප්‍රාථමික අලෙවිකරුගේ ස්වාධීනත්වය හෝ තමා විසින් සපයනු ලබන තොරතුරුවල ස්වාධීනත්වය; සහ

(ආ) ප්‍රචාරණය කරන ලද සේවාව සැපයීමට ප්‍රාථමික අලෙවිකරුට ඇති හැකියාව.

12.3 ප්‍රාථමික අලෙවිකරු වෙළෙඳ දැන්වීමක් පළ කිරීමේදී එකී වෙළෙඳ දැන්වීමෙහි තම නම පැහැදිළිව පෙන්නුම් කරන බවට තහවුරු කරගත යුතුය.

12.4 ප්‍රාථමික අලෙවිකරු තම වෙළෙඳ දැන්වීම ඕනෑම ගනුදෙනුකරුවෙකුට එය වෙළෙඳ දැන්වීමක් බව වහා දැනගත හැකි අයුරින් සැලසුම් කර ඉදිරිපත් කළ යුතුය.

12.5 ප්‍රාථමික අලෙවිකරුවකු පහත කරුණු තහවුරු කර ගත යුතුයි:

(අ) ප්‍රචාරණය කරන ලද සේවාවට අදාළ මූලික තොරතුරු වෙළෙඳ දැන්වීමේදී පැහැදිළිව පෙනෙන අතර, එහි අන්තර්ගතය, නිර්මාණය හෝ ආකෘතිය කිසිදු ආකාරයකින් නොපැහැදිළි හෝ අප්‍රකට නොවන බව සහ;

(ආ) කුඩා මුද්‍රිත අකුරු හෝ පාද සටහන් ප්‍රමාණවත් තරමින් සහ පැහැදිළිව කියවිය හැකි අයුරින් තිබිය යුතු අතර ඒවා භාවිතා කර ඇත්තේ වෙළෙඳ දැන්වීමේ ප්‍රධාන කොටසෙහි අන්තර්ගත මූලික තොරතුරු ඌණපූරණය කිරීම සඳහා හෝ විස්තරාත්මකව දැක්වීම සඳහා පමණක් බව.

12.6 ප්‍රාථමික අලෙවිකරු තම වෙළෙඳ දැන්වීමෙහි සඳහන් කර ඇති ප්‍රවර්ධනාත්මක හෝ හඳුන්වා දීමේ පොලී අනුපාතිකයන් හෝ අනෙකුත් ප්‍රවර්ධනාත්මක අංගයන් කල් ඉකුත් වන දිනය පැහැදිළිව සඳහන් කර ඇති බව සහ එදිනෙන් පසුව අදාළ වන පොලී අනුපාතිකයන් හා අනෙකුත් කොන්දේසි හා සීමාවන් සම්බන්ධයෙන් ඇඟවීමක් සපයා ඇති බවට තහවුරු කළ යුතුය.

12.7 ප්‍රාථමික අලෙවිකරුගේ වෙළෙඳ දැන්වීම තුළ අන්තර්ගත යම් ප්‍රකාශනයක්, පොරොන්දුවක් හෝ පුරෝකතනයක් සඳහා පදනම් කරගත් ඕනෑම උපකල්පනයක් පැහැදිළිව, සාධාරණව සහ යාවත්කාලීනව ඉදිරිපත් කර ඇති බව තහවුරු කළ යුතුය.

12.8 ප්‍රාථමික අලෙවිකරු තම දැන්වීම මගින් සේවා එකකට වැඩි ගණනක් ප්‍රවර්ධනය කිරීමේදී එකී සෑම සේවාවකට අදාළ මූලික තොරතුරු ගනුදෙනුකරුට පහසුවෙන් වෙන්කර හඳුනා ගත හැකි අයුරින් පැහැදිළිව දැක්වෙන බවට තහවුරු කළ යුතුය.

12.9 ප්‍රාථමික අලෙවිකරු තම වෙළෙඳ දැන්වීමේ සඳහන් කර ඇති යම් සැසඳීම් සහ අසමානකම් පදනම් වන්නේ තමා විසින්ම තහවුරු කර ගන්නා ලද කරුණු මත හෝ දැන්වීම තුළ ප්‍රකාශ වන සාධාරණ උපකල්පන මත බව තහවුරු කළ යුතුය. මෙම කරුණු පැහැදිළි, සාධාරණ සහ තුලනාත්මක අයුරින් ඉදිරිපත් කළ යුතු අතර සංසන්දනය කිරීම් හෝ අසමානකම් කෙරෙහි වැදගත් වන කිසිවක් මග නොහැරිය යුතුය. අදාළ සේවා අතර වැදගත් වෙනස්කම් පැහැදිළිව පෙන්විය යුතුය.

## 13. දෝෂ නිරාකරණය

13.1 තම ගනුදෙනුකරුවන්ට බලපාන දෝෂ ඵලදායී ලෙස නිරාකරණය සඳහා ලිඛිත ක්‍රමවේදයක් ප්‍රාථමික අලෙවිකරු සතුව තිබිය යුතුය. මෙම ක්‍රමවේදය මගින් අවම වශයෙන් පහත අංගයන් සැලකිල්ලට ලක් කොට තිබිය යුතුය:

(අ) දෝෂයට අදාළ හේතුව හඳුනාගැනීම;

(ආ) බලපෑමට ලක්වූ සියළු ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම;

(ඇ) දෝෂවල පවතින රටාව පිළිබඳ යෝග්‍ය විශ්ලේෂණයක් ද සහිතව සැලකිල්ලට භාජනය වී ඇති යම් දෝෂයක් හුදකලා දෝෂයක්ද නැතිද යන්න පරීක්ෂාවට ලක් කිරීම:

(ඈ) දෝෂ නිවැරදි කිරීමේ ක්‍රියාවලියෙහි නිසි පාලනයක්; සහ

(ඉ) අදාළ දෝෂ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු තම ආයතනයේ අදාළ නිලධාරීන් සහ ක්‍රියාමාර්ගවලට අනුගත කිරීම සහ ඉහළ කළමනාකරණය දක්වා ඉදිරිපත් කිරීම.

13.2 ප්‍රාථමික අලෙවිකරුවකු යම් දෝෂයක් මුලින්ම සොයාගත් දින සිට මාස 02 ක් ඉක්මවා යාමට පෙර එය නිවැරදි කළ යුතුයි. එසේ කිරීමේදී ප්‍රාථමික අලෙවිකරු පහත කරුණු තහවුරු කළ යුතුය:

(අ) ඕනෑම පද්ධති ඇනහිටීමක් නිවැරදි කිරීම;

(ආ) හඳුනාගත් දෝෂය නැවත නැවතත් සිදුවීම වලක්වා ගැනීමට ඵලදායී පාලනයක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;

(ඇ) හැකි සෑම අවස්ථාවලදීම දෝෂයෙහි අහිතකර බලපෑමට ලක් වූ සියළු ගනුදෙනුකරුවන්ට ප්‍රමාණවත් පොලී ගෙවීමක් සහිතව ඔවුන්ගේ මුදල් ආපසු ගෙවීම ක්‍රියාත්මක කිරීම; සහ

(ඈ) සැපයූ සේවයෙහි වටිනාකමට හෝ සේවයෙහි පිරිවැයට බලපෑ හෝ අවාසිදායක බලපෑමක් කළ හැකි ඕනෑම දෝෂයක් සම්බන්ධයෙන් දැනට සිටින සහ පෙර සිටි බලපෑමට ලක්වූ සියලු ගනුදෙනුකරුවන් හැකි සෑම අවස්ථාවේදීම දැනුවත් කිරීම.

13.3 ප්‍රාථමික අලෙවිකරුවකු යම් දෝෂයක් හඳුනාගත් මුල්ම දින සිට මාස 02 ක් ඇතුළත විධිවිධාන 13.2 දක්වා ඇති ආකාරයට එකී දෝෂය හා සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මසක් ඇතුළත ලිඛිතව ශ්‍රී ලංකා මහ බැංකුවට දැන්විය යුතුය.

13.4 ප්‍රාථමික අලෙවිකරු ගනුදෙනුකරුවන්ට බලපාන සියලු වැරදි පිළිබඳව නිසි අඛණ්ඩ සටහනක් පවත්වාගෙන යා යුතුය. මෙම සටහනෙහි පහත සඳහන් දෑ අන්තර්ගත විය යුතු ය:

(අ) දෝෂය පිළිබඳ විස්තර ;

(ආ) දෝෂය සොයාගත් දිනය;

(ඇ) දෝෂය සොයාගත්තේ කෙසේද යන්න පිළිබඳ විස්තරයක්;

(ඈ) දෝෂයේ බලපෑමට යටත්වූ කාලසීමාව;

(ඉ) දෝෂයේ බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව;

(ඊ) දෝෂයට සම්බන්ධ වුණු මුදල්මය අගය;

(උ) දෝෂයෙහි තත්ත්වය;

(ඌ) දෝෂය නිවැරදි කළ දිනය ;

(එ) දෝෂයේ බලපෑමට යටත්වීම නිසා අගතියට පත් ගනුදෙනුකරුවන් සංඛ්‍යාව හා ඔවුන් එක් එක් අයට ආපසු ගෙවූ මුදල් ප්‍රමාණය;

(ඒ) ආපසු ගෙවූ මුළු වටිනාකම.

13.5 ප්‍රාථමික අලෙවිකරුවකු විසින් ගනුදෙනුකරුවන්ට බලපාන දෝෂ නිවැරදි කිරීම සඳහා ගන්නා ලද සියලු පියවරයන්හි තොරතුරු ඇතුළත් වාර්තාවක් පවත්වා ගත යුතු අතර එකී වාර්තාවල තත්ත්වයන් පැහැදිළි ලෙස සටහන් කර තිබිය යුතුය:

(අ) දෝෂ නිරාකරණයේ අවසන් ප්‍රතිඵලය පිළිබඳව යම් ගනුදෙනුකරුවකු අතෘප්තිමත් වූ අවස්ථා;

(ආ) දෝෂයේ බලපෑමට යටත්වූ නමුදු එකී ගනුදෙනුකරුවන් සම්බන්ධ කරගැනීමේ දුෂ්කරතා තිබූ අවස්ථාව;

(ඇ) දෝෂ නිරාකරණයේ අවසන් ප්‍රතිඵලය ලෙස මුදල් ආපසු දියයුතු වූ නමුත් එසේ මුදල් ගෙවීමට නොහැකි වූ අවස්ථා.

## 14. පැමිණිලි නිරාකරණය

14.1 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ඕනෑම පැමිණිල්ලක් නිරාකරණය කිරීමට කටයුතු කළ යුතුය.

14.2 ප්‍රාථමික අලෙවිකරුවකු වෙත තම ගනුදෙනුකරුවකුගෙන් වාචික පැමිණිල්ලක් ලැබුණු විට, එවන් පැමිණිලි නිරාකරණය කිරීම සඳහා තම ආයතනයේ පවත්නා අනුමත ක්‍රමවේදය ප්‍රකාරව එම වාචික පැමිණිල්ල නිරාකරණය කිරීම සඳහා ගනුදෙනුකරුහට අවස්ථාව සලසා දිය යුතුය.

14.3 ප්‍රාථමික අලෙවිකරු සතුව ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි පිළිබඳව ක්‍රියාත්මක කෙරෙන ආකාරය නිසි ලෙස දැක්වෙන අනුමත ලිඛිත ක්‍රමවේදයක් තිබිය යුතුය. එනමුදු වැඩ කරන දින 05 ඇතුළත පැමිණිලිකරුවන් තෘප්තිමත් වන ලෙසට ඔවුන්ගේ පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් තම ආයතන තුළ පවත්නා ප්‍රාථමික අලෙවිකරුවන්ට මෙම අවශ්‍යතා අදාළ නොවේ. එනමුදු සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් තමන් වෙත ලැබෙන පැමිණිලි හා ඒවා නිරාකරණය කළ ආකාරය පිළිබඳ වාර්තාවක් පවත්වා ගත යුතුය. අවම වශයෙන් මෙම ක්‍රියාවලියේදී:

(අ) ප්‍රාථමික අලෙවිකරුට පැමිණිල්ල ලද බවට එය ලැබී වැඩ කරන දින 05 ක් ඇතුළත අදාළ ගනුදෙනුකරුට ලිඛිතව දන්වා යැවිය යුතුය;

(ආ) ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුගේ පැමිණිල්ල විසඳා අවසන් වන තුරු එකී පැමිණිල්ල සම්බන්ධව ක්‍රියා කිරීමට එක් අයෙකු හෝ ඊට වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් පත් කොට ඔවුන්ගේ නම් පැමිණිලිකරුට දන්වා යැවිය යුතුය;

(ඇ) ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරු පැමිණිල්ල ඉදිරිපත් කළ දින සිට වරින් වර එම පැමිණිල්ල විමර්ෂණයෙහි ප්‍රගතිය පිළිබඳව ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය. එසේ සිදුකෙරෙන දැනුම් දීම් අවම වශයෙන් දින 20 කට වරක් වත් සිදු කළ යුතුය;

(ඈ) ප්‍රාථමික අලෙවිකරු විසින් යම් පැමිණිල්ලක් ලැබී ප්‍රථම වැඩ කරන දින 40 ඇතුළත එය විමර්ශනය කොට විසඳීමට උත්සාහ දැරිය යුතුය; අදාළ පැමිණිල්ල ප්‍රථම දින 40 තුළ නොවිසඳුන විටක ප්‍රාථමික අලෙවිකරු විසින් එම පැමිණිල්ල විසඳීමට අපේක්ෂිත කාල වකවානුව පැමිණිලිකරුට ලිඛිතව දැන්විය යුතු අතර, තවද, ගනුදෙනුකරුට තම ගැටළුව මූල්‍ය කටයුතු පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයා වෙත ද යොමු කළ හැකි බව ඔම්බුඩ්ස්මන්වරයාගේ ලිපිනය හා අනෙකුත් විස්තර ද සමග පැමිණිලිකරුට ලබා දිය යුතුය.

(ඉ) ප්‍රාථමික අලෙවිකරු විසින් තම පැමිණිලි විමර්ශණය සම්පූර්ණ කර වැඩකරන දින 05 ක් ඇතුළතදී, අදාළ ගනුදෙනුකරුට පහත සඳහන් දෑ ලිඛිතව දැනුම් දිය යුතුය:

(i) පැමිණිලි විමර්ශණයෙහි ප්‍රතිඵලය;

(ii) පැමිණිල්ල සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් සිදුකෙරෙන යම්කිසි යෝජනාවක් හා ඊට අදාළ කොන්දේසි හෝ පැමිණිල්ල සමථයකට පත්කරන ආකාරය;

(iii) ගනුදෙනුකරුට ගැටළුව මූල්‍ය කටයුතු පිළිබඳව ඔම්බුඩ්ස්මන් වරයාට යොමු කළ හැකි බව; සහ

(iv) මූල්‍ය කටයුතු පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයාගේ ලිපිනය.

14.4 ප්‍රාථමික අලෙවිකරු විසින් තම ගනුදෙනුකරුවන් යොමු කරන ලද සියළු පැමිණිලි පිළිබඳව පැමිණිලි ක්‍රියාපටිපාටියට අනුකූල යාවත්කාලීන ලේඛනයක් පවත්වා ගත යුතුය. මෙම ලේඛනයෙහි අවම වශයෙන් පහත දැක්වෙන කරුණු අඩංගු වියයුතු ය:

(අ) එක් එක් පැමිණිල්ලේ තොරතුරු;

(ආ) පැමිණිල්ල කරනු ලැබූ දිනය;

(ඇ) දිනය සහිතව ප්‍රාථමික අලෙවිකරුගේ ප්‍රතිචාරයෙහි සාරාංශයක් ;

(ඈ) වෙනත් ඕනෑම අදාළ වාර්තා හෝ හුවමාරු ලියකියවිලිවල තොරතුරු;

(ඉ) එක් එක් පැමිණිල්ල විසඳීම සඳහා ගත් ක්‍රියාමාර්ගය;

(ඊ) පැමිණිල්ල නිරාකරණය කළ දිනය; සහ

(උ) අදාළ වන්නේ නම් පමණක් මූල්‍ය කටයුතු පිළිබඳ ඔම්බුඩ්ස්මන් වරයාට යොමු කරන ලද පැමිණිලිවල වර්තමාන තත්ත්වය.

14.5 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුගෙන් ලැබුණු එක් එක් පැමිණිල්ල සඳහා යාවත්කාලීන සහ විස්තරාත්මක වාර්තාවක් පවත්වා ගත යුතුය.

14.6 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුවන්ගෙන් ලද පැමිණිලි සුදුසු විශ්ලේෂණයකට භාජනය

කොට ඒවා සියළු ගනුදෙනුකරුවන්ට පොදු හෝ එක් ගනුදෙනුකරුවකුට විශේෂිත වූ පැමිණිලි දැයි පරීක්ෂා කළ යුතුය. ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි පිළිබඳ මෙම විශ්ලේෂණය ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අනුකූලතා/අවදානම් කළමනාකරුවන්ගේ සැලකිල්ලට ලක් කළ යුතු අතර ඉහළ කළමනාකාරිත්වය වෙත ද ඉදිරිපත් කළ යුතුය.

## 15. වාර්තා සහ අනුකූලතාව දැක්වීම

15.1 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරුගෙන් හෝ ගනුදෙනුකරු වෙනුවෙන් ලැබුණු සියලු උපදෙස් පිළිබඳව එකී උපදේශය ලැබුණු සහ යොමු කළ යන දින දෙක ද ඇතුළත්ව වාර්තා තබාගත් බව තහවුරු කළ යුතුය.

15.2 ප්‍රාථමික අලෙවිකරු තම ගනුදෙනුකරු වෙනුවෙන් තම අභිමතාර්ථය පරිදි ගනු ලබන සියළුම තීරණ නිසි පරිදි ලේඛන ගතකොට තබා ගත යුතුය;

15.3 ප්‍රාථමික අලෙවිකරු විසින් අවම වශයෙන් පහත දැ ඇතුළත්වූ වාර්තාවක් යාවත්කාලීන ආකාරයෙන් පවත්වා ගත යුතුය:

(අ) ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා අවශ්‍ය සියළුම ලිපි ලේඛනවල පිටපත් ;

(ආ) ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේ තොරතුරු;

(ඇ) මෙම ප්‍රඥප්තියට අනුකූලව පිළියෙල කරන ලද සියලුම තොරතුරු සහ ලිපි ලේඛන;

(ඈ) ගනුදෙනුකරුට සැපයූ සේවාවේ විස්තර;

(ඉ) ගනුදෙනුකරු සමග සිදුකළ සියලු ලිපි ගනුදෙනු සහ මූල්‍ය සේවාව හා සම්බන්ධව ගනුදෙනුකරුට සැපයූ අනෙකුත් සියලු තොරතුරු;

(ඊ) ගනුදෙනුකරු විසින් අත්සන් තබන ලද හෝ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සහ සියලු ලිපි ලේඛන;

(උ) සේවාව සැපයීමේදී ගනුදෙනුකරු විසින් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ සියලුම මුල් ලියකියවිලිවල පිටපත් ; සහ

(ඌ) ගනුදෙනුකරු සම්බන්ධ අනෙකුත් සියලු තොරතුරු සහ ලිපි ලේඛන.

15.4 ප්‍රාථමික අලෙවිකරු සිය ගනුදෙනුකරුවන්ට සැපයූ සේවාවල තොරතුරු අදාළ සේවාව කල්පිරීමේ දින සිට හෝ සම්පූර්ණ කළ දින සිට වසර පහක කාල සීමාවක් දක්වා සුරක්ෂිතව තබා ගත යුතුය. ගනුදෙනුකරුට සපයන වෙනත් සේවාවක් අවසන් කළ දින සිට වසර පහක් දක්වා කාලයක් එම සේවාවට සම්බන්ධ සියලුම වාර්තා සුරක්ෂිතව තබා ගත යුතුය.

15.5 ප්‍රාථමික අලෙවිකරු විසින් ගනුදෙනුකරුගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා, පරිපූර්ණ සහ පහසුවෙන් පරිශීලනය කළ හැකි ලෙස එම වාර්තා පවත්වාගෙන යා යුතු අතර අවශ්‍ය පරිදි එම වාර්තාවලට උපස්ථ වාර්තා (backup records) සම්පූර්ණයෙන් ආරක්ෂිත වෙනත් ස්ථානයක ද තබාගත යුතුය.

## 16. මෙම ප්‍රඥප්තියට අනුකූල වීම

16.1 රාජ්‍ය ණය අධිකාරී විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී ඕනෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින් තමා මෙම ප්‍රඥප්තියට අනුකූල වීම පිළිබඳව තොරතුරු රාජ්‍ය ණය අධිකාරී විසින් විශේෂයෙන් දක්වනු ලබන ඕනෑම කාල පරිච්ඡේදයකට අදාළව හෝ ඕනෑම ආකෘතියකට අනුව සැපයිය යුතු අතර, ඒවා සෑම අතින්ම පරිපූර්ණ, අපක්ෂපාතී, නිරවද්‍ය වියයුතු මෙන්ම නොමග යවනසුළු නොවිය යුතුය.

16.2 රාජ්‍ය ණය අධිකාරී විසින් ප්‍රාථමික අලෙවිකරුගේ සේවක මණ්ඩලය සමග රැස්වීමක් පවත්වා එකී ප්‍රාථමික අලෙවිකරු මෙම ප්‍රඥප්තියට අනුකූල දැයි පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් තොරතුරු රැස් කිරීමට තීරණය කළ විටෙක එසේ දන්වනු ලබන ඕනෑම අවස්ථාවකදී ඕනෑම ප්‍රාථමික අලෙවිකරු වකු විසින් අවශ්‍ය තොරතුරු රාජ්‍ය ණය අධිකාරීට සැපයීම සඳහා නිසි සේවකයෙකු/සේවක පිරිසක් එම රැස්වීමට සහභාගී කරවීමට කටයුතු කළ යුතුය.

16.3 රාජ්‍ය ණය අධිකාරී විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී ඕනෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින් තමා මෙම ප්‍රඥප්තියට අනුකූල වීම තහවුරු කිරීමට ප්‍රමානවත් වාර්තා යම් විශේෂයෙන් දක්වන ලද කාල පරිච්ඡේදයකට (උපරිම වශයෙන් වසර 6 ක් සඳහා) ඉදිරිපත් කළ යුතුය.

## 17. ප්‍රාථමික අලෙවිකරු සම්බන්ධයෙන් ගනුදෙනුකරුට ඇති බැඳීම

ඕනෑම පුද්ගලයෙකු විසින් යම් ප්‍රාථමික අලෙවිකරුවෙකු හා ගනුදෙනු කිරීමේදී සිය වගකීම් හා බැඳීම් නිසියාකාරව ඉටු කිරීම මගින් එම සම්බන්ධතාවය වර්ධනය කරගත යුතුය. ඒ සඳහා ද අවම වශයෙන් පහත තත්ත්වයන් සැලකිල්ලට ගත යුතුය:

(අ) ගනුදෙනුකරු විසින් ප්‍රාථමික අලෙවිකරුවකුගෙන් යම් සේවාවක් ලබාගෙන ඇති අවස්ථාවකදී කිසියම් හෝ හේතුවක් මත තම නාමය මධ්‍යම සුරැකුම්පත් ක්‍රමයෙහි වාර්තා කිරීමෙන් වලකින ලෙස ප්‍රාථමික අලෙවිකරුට උපදෙස් ලබා නොදිය යුතුය;

(ආ) ගනුදෙනුකරුට තමා ලබාගත් සේවාව මුලින් එකඟ වූ කල්පිරීමේ දිනට කලින් ඉවත් කර ගැනීමට/අවසාන කිරීමට අවශ්‍ය වූ විටකදී, ඒ වනවිට පවතින වෙළෙඳපොල පොලී අනුපාතවලට අනුව සිදු වියහැකි මූල්‍ය අලාභය අලාභය/වන්දිය/අව මිල ඔහු/ඇය විසින් දරාගත යුතුය;

(ඇ) ගනුදෙනුකරු විසින් ගිවිසගත් පරිදි, ප්‍රාථමික අලෙවිකරු සඳහා වූ කිසියම් මූල්‍ය වගකීමක් පියවීමට අපොහොසත් වූ විටකදී, තමන්ට අය වියයුතු මුදල් ප්‍රමාණය ඕනෑම සුරැකුමක් හරහා ආපසු ලබා ගැනීමේ අයිතිය එම ප්‍රාථමික අලෙවිකරුට ඇත. යම් විදියකින් ප්‍රාථමික අලෙවිකරු විසින් ගිවිසගත් පරිදි තම මූල්‍ය වගකීම් පියවීමට අපොහොසත් වූ විටකදී, ඕනෑම සුරැකුමක් මගින් තමන්ට අය වියයුතු මුදල් ප්‍රමාණය ලබා ගැනීමේ අයිතිය ගනුදෙනුකරුට තහවුරු කළ යුතුය;

(ඈ) ගනුදෙනුකරු විසින් තමන් මූල්‍ය අපහසුතාවයකට පත් වූ විටකදී ඔහු/ඇය ඒ බව හැකි ඉක්මනින් ප්‍රාථමික අලෙවිකරුට දැනගැනීමට සැලැස්විය යුතුය;

(ඉ) ගනුදෙනුකරු ඕනෑම අවස්ථාවක සම්බන්ධ කර ගැනීමට පහසුකම් සලසනු වස් හා මධ්‍යම සුරැකුම්පත් ක්‍රමයෙහි තොරතුරුවල යාවත්කාලීන හා නිවරද්‍ය අන්දමින් පවත්වා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් අනිවාර්යයෙන්ම සියළුම අවස්ථාවන්හිදී තම ලිපිනය, දුරකථන අංක, ඊමේල් ලිපිනය යනාදියෙහි ඕනෑම වෙනස්වීමක් ප්‍රාථමික අලෙවිකරුට දැන්විය යුතුය;

(ඊ) ප්‍රාථමික අලෙවිකරු විසින් යෝජිත මූල්‍ය සේවාව පිළිබඳව පරිපූර්ණ අවබෝධයක් ගිවිසුමට එළඹීමට පෙර ගනුදෙනුකරු තුළ තිබිය යුතුය;

(උ) ගනුදෙනුකරු විසින් අවශ්‍ය ඉල්ලුම් පත්‍ර සහ ලිපි ලේඛන නියමිත වේලාවට නිසි පරිදි සම්පූර්ණ කර භාර දිය යුතුය;

(ඌ) ගනුදෙනුකරු තමා ප්‍රාථමික අලෙවිකරු සමග සිදුකරන සෑම ගනුදෙනුවක්ම මනා සැලකිල්ලකින් යුතුව සිදුකළ යුතුය;

(එ) තමන් ප්‍රාථමික අලෙවිකරු සමග සිදුකරනු ලබන ගනුදෙනු සඳහා කුවිතාන්සියක්/

ගිණුම් ප්‍රකාශයක් ලබා ගැනීමට ගනුදෙනුකරු වගබලා ගත යුතුය. ඉන් පසුව ගනුදෙනුකරු ප්‍රාථමික අලෙවිකරු තමන්ට ලබා දුන් කුවිතාන්සිය/ගිණුම් ප්‍රකාශය මැනවින් කියවා බලා එහි ඇති ඕනෑම වැරදීමක්/මගහැරීමක්/ සැකසහිත ගනුදෙනුවක් ඇතොත් ඒ පිළිබඳව ඉතා ඉක්මනින් ප්‍රාථමික අලෙවිකරු දැනුවත් කළ යුතුය.